# මංසල

සந்தித்தல் / The Meeting Point

*Quarterly Newsletter of the Ministry of Industry and Commerce*

**Issue XXI (Final & Special issue)** **July to December 2015**



Ministry of Industry and Commerce,
73/1, Galle Road,
Colombo 3
Tel: 011-2392150
Web: www.industry.gov.lk
E-mail:info@industry.gov.lk





Ministry of Industry and Commerce



For the previous issues of "Mansala", please visit our website **www.industry.gov.lk**

**UNITY IS STRENGTH... WHEN THERE IS TEAMWORK AND COLLABORATION, WONDERFUL THINGS CAN BE ACHIEVED.**
- Mattie Stepanek -
purehappylife.com

## *Highlights...*


- ඇසුරුම් තාක්ෂණය හා නිර්මාණකරණය පිළිබඳ දින 12ක නේවාසික පුහුණු වැඩමුළුව ........ 2
- *Editorial* ........ 3
- *Poetry Corner* ........ 4
- *Round Table Discussions with Swiss Businesses in Sri Lanka* ........ 5
- සැකසූ ආහාර, සැකසූ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය - *2015* ........ *6 & 7*
- *Activities of the Ministry* ........ *8*


ශිල්ප
சில்பா / SHILPA

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාතික ශිල්ප සභාව විසින් සංවිධානය කරන ලද "ශිල්ප 2015" ජාතික අත්කම් ප්‍රදර්ශනය 2015 දෙසැම්බර් මස 3 සිට 5 දක්වා ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මෙහි දැක්වෙන්නේ එහි විශේෂ අවස්ථා කිහිපයකි.**











# ඇසුරුම් තාක්ෂණය හා නිර්මාණකරණය පිළිබඳ දින 12 ක නේවාසික පුහුණු වැඩමුළුව

කේ. එච්. ජයරත්න
කර්මාන්ත සංවර්ධන නිලධාරි
සංවර්ධන අංශ 1

මෙම වැඩසටහන 2008 වර්ෂයේ දී ආරම්භ කරන්නට යෙදුනු අතර, ඇසුරුම් කර්මාන්ත ක්ෂෙත්‍රයේ සේවා නියුක්ත තාක්ෂණික මට්ටමේ ශිල්පීන් පුහුණු කිරීම තුළින් ඇසුරුම් කර්මාන්තයේ ප්‍රගතිය උදෙසා වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. දෙවසරකට වරක් පැවැත්වෙන මෙම පුහුණුව ලිඛිත, ප්‍රයෝගික හා කර්මාන්ත නිරීක්ෂණවලින් සමන්විත අංග සම්පූර්ණ වැඩසටහනකි. ආසියාවේ ඉහළ කීර්තිනාමයක් දිනා සිටින ඉන්දියානු ඇසුරුම් මධ්‍යස්ථානයේ (IIP) දී පවත්වනු ලබන මෙම නේවාසික පුහුණු පාඨමාලාව සඳහා සහභාගිවීමට ඇති ඉල්ලුම සෑම වසරකදීම වැඩිවෙමින් පවතී. මෙම වැඩසටහන සංවිධානය සඳහා ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP) පූර්ණ සහයෝගය ලබා දෙනු ලැබේ.


ගුවන් ටිකට්පත් ප්‍රදානය කිරීම

මෙම වර්ෂයේ පුහුණුව 2015 මැයි 11 වන දින සිට 22 දක්වා පවත්වන ලද අතර ඒ සඳහා ශිල්පීන් 20 දෙනෙකුට අවස්ථාව හිමිවිය.

මෙම පුහුණුව සඳහා ඉන්දියාවේ ඇසුරුම් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් සම්පත් දායකයන් ලෙස යොදාගනු ලබන අතර එය පුළුල් විෂය මාලාවකින් අන්තර්ගත උසස් පාඨමාලාවකි.

පුහුණු කාලය තුළ දී, පුහුණුවන්නන්හට ඉන්දියානු ඇසුරුම් කර්මාන්තය තුළ නිෂ්පාදන ක්‍රියාවලින් ප්‍රායෝගිකව සිදුවන අයුරු මෙන්ම ඇසුරුම් කර්මාන්තයේ දී පර්යේෂණාගාර භාවිතා කරන අන්දම ද දැක බලා ගැනීමේ අවස්ථාව උදා වේ.

මෙම පුහුණුව තුළ විවිධ වර්ගයේ ද්‍රව්‍ය යොදාගෙන නිර්මාණශීලිව කරනු ලබන ඇසුරුම් කරණයන් පිළිබඳව අත්දැකීම් ලබාගැනීමට ද අවස්ථාව ලැබේ. ප්ලාස්ටික්, කඩදාසි, ටින්, වීදුරු සහ නම්‍යශීලි ඇසුරුම්කරණය ආදී සියලුම වර්ගයේ ඇසුරුම්කරණයන් පාඨමාලාව තුළ අන්තර්ගත වේ.

එමෙන්ම ආහාර ඇසුරුම්කරණය සඳහා තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කරන ලද ඇසුරුම්කරණය පිළිබඳවත්, වර්තමාන ලෝකයේ වැඩි අවධානයක් යොමුවී පවතින පරිසර හිතකාමී ඇසුරුම් කරණය සහ නිෂ්පාදනය සිදු කරනුයේ කෙසේද යන්න පිළිබඳවත් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබේ.


පුහුණුවට සහභාගි වූවන්ගේ සමූහ ඡායාරූපය

මෙම පුහුණුලාභීන් ලබා ගත් දැනුම සහ අත්දැකීම් තුළින් දේශීය ඇසුරුම් කර්මාන්තය නව මගකට ගෙන ඒමට අවශ්‍ය පූර්ණ දායකත්වය සපයනු ඇතැයි කර්මාන්ත අමාත්‍යාංශය වන අපගේ ඒකායන බලාපොරොත්තුව වේ.

*"I am a strong individualist by personal habit, inheritance, and conviction; but it is a mere matter of common sense to recognize that the State, the community, the citizens acting together, can do a number of things better than if they were left to individual action."*
**- Theodore Roosevelt**

# Editorial
## - The Wrap Up -

*"This country has known neither famine nor rebellion."* – Fa Hien on Sri Lanka (5th Century A.D.)

Having blessed with favourable climatic and geographical conditions and skillful as well as intelligent people, why couldn't Sri Lanka sustain its ancient glory? The answer is simple – the country has lost the unity and the integrity of its people.

The secret behind the massive irrigation tanks, sky scraping stupas, the large-scale agriculture which made Sri Lanka the 'Granary of the East', was not slavery but voluntary labour that the people contributed as a duty towards the country.

> වැවක් සකස් කර අවසන් වූ පසු එය රැක බලා ගැනීම හා නඩත්තු කටයුතු ගම් වැසියන් විසින් තම පරම යුතුකමක් ලෙස සලකමින් ඉටුකරන ලද අතර, වසර දහස් ගණනක් තිස්සේ මෙම වැව් මගින් ගොවිබිම් සරු කිරීමට හැකි වූයේ අපගේ පැරැන්නන් තුල පැවති එම පරාර්ථකාමී ගුණයයි.
>
> මග මානවක ජාතකයෙහි දැක්වෙන පරිදි මග මානවක සහ මිතුරු පිරිස විසින් විශ්‍රාම ශාලා, දන් සැල්, ජලාශ, යනාදිය ස්වකීය ශ්‍රමයෙන් ඉදිකරමින් පොදු මහ ජනතාවට සේවය කළ අතර, එම මිතුරු කැලෙහි සමගියට හේතු වූයේ ඔවුන් තුළ වූ සෘජු ගුණය හා එකිනෙකා කෙරෙහි දැක්වූ අවංකභාවයයි.
>
> එබැවින් පුද්ගලයකුගේ හෝ ආයතනයක හෝ සමස්ත සමාජයෙහිම අභිවෘද්ධිය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම හේතු සාධක වනුයේ එකමුතුබව (unity) අවංකභාවය හා අධ්‍යාත්මික සංවර්ධනයයි (integrity).

The people were richly rewarded by the rulers for their contribution, as illustrated in the following excerpt from the 'Mahavamsa' on the construction of the Ruwanveliseya.

"When the king (Dutugemunu) heard this, glad at heart, he began work on the thupa. And he made it known; **'Work shall not be done here without wage:** At every gate he commanded to place sixteen hundred thousand kahapanas, very many garments, different ornaments, solid and liquid foods and drink withal, fragrant flowers, sugar and so forth, as well as the five perfumes for the mouth." (The Mahavamsa or the Great Chronicle of Ceylon, English Translation by Wilhelm Geiger, Page 199)

This contrasts sharply with the fact that not only the Great Wall of China and the pyramids of Egypt - which belong to the ancient world – were built by slaves, but thousands of slaves were engaged in agricultural and industrial activities in many countries in the western world, even in more recent times.

# United we stand – divided we fall

It has been observed that at present, personal differences and grudges hinder the progress of many organizations in Sri Lanka, particularly in the public sector, which in turn, adversely affects the communication not only between institutions, but also within one.

Hence, it is the responsibility of each individual as well as the heads of these institutions to refrain from / discourage negative attitudes and behaviour, such as dishonesty, tale bearing, gossiping & malice, and to cultivate integrity and respect for each other, which would ensure unity amongst the staff.

However, it is only through purifying oneself that the unity at institutional level, and in turn, at national level could be achieved.

The following poem shows the path towards becoming a self respecting human being, acceptable in a civilized society.

## Myself

**by Edgar Guest**

I have to live with myself, and so,
I want to be fit for myself to know;
**I want to be able as days go by,**
**Always to look myself straight in the eye;**
**I don't want to stand with the setting sun**
**And hate myself for the things I've done.**
I don't want to keep on a closet shelf
A lot of secrets about myself,
And fool myself as I come and go
Into thinking that nobody else will know
The kind of man I really am;
I don't want to dress myself up in sham.
I want to deserve all men's respect;
But here in this struggle for fame and pelf,
**I want to be able to like myself.**
I don't want to think as I come and go
That I'm for bluster and bluff and empty show.
**I never can hide myself from me,**
**I see what others may never see,**
**I know what others may never know,**
**I never can fool myself -- and so,**
**Whatever happens, I want to be**
**Self-respecting and conscience free.**

*Inoka de Alwis*

***"The greater the loyalty of a group toward the group, the greater is the motivation among the members to achieve the goals of the group, and the greater the probability that the group will achieve its goals."***
**- Rensis Likert**

# කැටපත් පවුර



## ගිලිහුණ කඳුළු කැට

සරනසැරි රඟන සියොතුන් පිරි ගඟන
ගත්තේ නිල්වන් පැහැ සොරාගෙන වාපි දී බිඳු

චණ්ඩාතපයෝ රටා මවනුයේ
පැලුම් ඉරෙන් වැව් පතුලේ
උදුරාගෙන අප පණ නළ
බව නොදැන ද...

අඩවාරුවෙන් තබා යන්නේ ගව් ගණන්
සොයන්නට දී බිඳු
පුදුමයි නොපිරුණා වැව් කුස
ගිලිහුණ කඳුළු කැට එක්ව

එල්.ඩී.සී.ටී.ජයසිංහ
ලේකම් අංශය

**මංසල** was compiled by Inoka de Alwis, Assistant Director, with the assistance of Ms. Subhashini Shiromani – Industrial Development Officer and Ms. Chathurika Athukorala, Management Assistant. Some of the photographs were provided by the staff of the Media Unit of the Ministry of Industry & Commerce.

## මවකගේ පැතුම...



දස මසක් මා
නුඹව කුස දරා
මෙලොවට බිහිකර
ලේ කිරිකර දුන්නා...

ලෙඩක දී දුකක දී
නිදිවරමින් නුඹ ළඟ සිට
හිස අත ගා සනසවමින්
මා දුක් වින්දා...

මම නොකා හෝ නුඹට කවා
නුඹ කුස ගිනි නිව්වා
පියා නොමැති නුඹහට මා
විටෙක පියෙකු ද වූවා...

පතිකුලයට යන අද දින
නුඹව වැළඳගෙන මා
දරූ දුක් දරාගෙන හිතේ
ආසිරි පැතුවා...

දිනක් රෑ ජාමෙක
පන්සල් යමුයි කියා
මා මහ මග දමා ගිය දින
නුඹට මා බරක්
වූ බව දැනුනා...

අද මට සෙවනක් වූ
මහලු මඩමේ සිටියත්
කන්න බොන්න සැප
නොඅඩුව ලැබුණත්
නුඹව පෙනි පෙනී සිටින්න
ඇත්නම් පැතුවා...

අමතක කරන්න නොහැකිය
දෑස මෙන් හැදූ වැඩූ නුඹව
සතුටින් ඉනු මැන දුවේ
සැමියා හා පුතු සමඟින සැමදා...

දර්ශනී භාග්‍යා සුබසිංහ
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

*"To build an effective community, everyone must realize that their community is bigger than them."*
**- Idowu Koyenikan**

# Round Table Discussion with Swiss Businesses in Sri Lanka

A Round Table Discussion with Swiss Businesses in Sri Lanka organized by the Department of Commerce, in collaboration with the Swiss Embassy in Sri Lanka and the Sri Lanka Export Development Board (EDB), was successfully held on 13th May, 2015 at the Auditorium of the EDB. The objective of this discussion was to discuss possibilities of expanding Swiss investments in Sri Lanka and to exchange views on their business operations in Sri Lanka.

The discussion was chaired by Hon. Rishad Bathiudeen, Minister of Industry & Commerce and Dr. Harsha De Silva, Hon. Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth & Cultural Affairs graced the event as the Guest of Honour. Representatives from over 20 Swiss businesses based in Colombo participated at this event.

The gathering was welcomed by the Director General of Commerce, followed by an address and a presentation by H.E. Heinz Walker-Nederkoorn, Ambassador of Switzerland in Sri Lanka and the Maldives. Three Swiss companies, viz., Holcim Lanka Ltd., A. Baur& Co. (Pvt.) Ltd. and Roche Products Colombo (Pvt) Ltd., conducted presentations at the session sharing their experiences about doing businesses in Sri Lanka, CSR programmes carried out by them in Sri Lanka, details for future investment plans, opportunities and challenges in doing business in Sri Lanka etc.

As a follow up to the round table discussion, a Swiss delegation consisting of senior officials and business representatives visited Sri Lanka in the third week of May 2015. The objective of this visit was to explore the opportunities available for Swiss buyers in Sri Lanka. The delegation was headed by H.E. the Ambassador Dr. Livia Leu, Head of Bilateral Economic Relations Division at the State Secretariat for Economic Affairs (SECO). Chairman of Swiss Asian Chamber of Commerce, H.E. the Ambassador of Switzerland and two Embassy Officials represented the delegation.

The Department of Commerce facilitated the delegation by arranging meetings with Hon. Minister of Industry & Commerce, Hon. Deputy Minister of Investment Promotion, Executive Director of BOI, Executive Director of EDB & officials and Secretary General of Ceylon Chamber of Commerce. Throughout these meetings, it was discussed the utilization of Swiss-GSP facility given to Sri Lanka, economic reforms, opportunities available for investors, upgrading the Avoidance of Double Taxation Agreement & Bilateral Investment Treaty etc.

**- Department of Commerce**

***"Teamwork is the best ever investment. If I make 3 and you make 5, together we will not make 8. We will make 15. Leaders build active teams!"*** **- Israelmore Ayivor**

# සැකසූ ආහාර සැකසූ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2015

කමල් වන්නිආරච්චි
සංවර්ධන නිලධාරි - සංවර්ධන අංශ 1

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආහාර සැකසුරුවන්ගේ සංගමය එක්ව වාර්ෂිකව පවත්වන සැකසූ ආහාර සැකසූ ඇසුරුම් ජාත්‍යාන්තර ප්‍රදර්ශනය (Profood/ Propack International Exhibition) අතිසාර්ථකව 14 වන වරටත් 2015 අගෝස්තු මස 07, 08 හා 09 යන දිනයන්හිදී ඉතා උත්කර්ශවත් ලෙස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.



සැකසූ ආහාර හා සැකසූ ඇසුරුම් පිළිබඳව ශ්‍රී ලංකාවේ දී පැවැත්වෙන ප්‍රධානතම හා විශාලතම ප්‍රදර්ශනය වන මෙහි සමාරම්භක උළෙල මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්.එස්. මියනවල හා දෙස් විදෙස් නියෝජිතයන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. තවද මෙම ප්‍රදර්ශනය නැරඹීම සදහා ප්‍රධාන පෙලේ මැති ඇමතිවරු කිහිප දෙනෙක් ඇතුළුව විශාල පිරිසකගේ සහභාගිවීම මගින් දේශීය හා විදේශීය ප්‍රදර්ශකයන් දිරිමත් කිරීම ද සිදුකෙරිණි.

"ගොවිපලේ සිට මුලුතැන්ගෙය දක්වා" තේමාව කරගත් මෙම ප්‍රදර්ශනය, දේශීය-විදේශීය වෙළෙඳ කුටි 280 කින් සමන්විත වූ අතර සමස්ත අහාර සැපයුම් ක්‍රියාවලියම මෙම ප්‍රදර්ශනය මගින් මනාව පිළිබිඹු කර තිබුණි. මෙහිදී පාරිභෝගිකයින්, ආයෝජකයින්, වෙළෙඳුන් හා නිෂ්පාදකයින්ට ආහාර නිෂ්පාදනය හා ඇසුරුම්කරණය, රසවත් ආහාර වේලක් සාදාගන්නා අකාරය පිළිබඳව දැනුවත් කිරීම, විශේෂ දේශන හා වැඩමුලු මගින් සංවිධානය කර තිබිණි. තවද නව තාක්ෂණික ක්‍රමවේද හා නවතම සොයා ගැනීම්, විශ්වවිද්‍යාල හා දේශීය නව නිෂ්පාදනකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණි. මීට අමතරව ආහාර කර්මාන්තයට අදාළ නවතම ආහාර සැකසුම් හා ඇසුරුම්කරන යන්ත්‍ර, තාක්ෂණික උපදෙස්, ආහාරවල සුරක්ෂිතාවය සහ එහි වැදගත්කම පිළිබඳව පාරිභෝගිකයන්ට මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවීම මෙම ප්‍රදර්ශනයේ ඇති සුවිශේෂත්වයකි.



කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් කර්මාන්තකරුවන් සඳහා වූ විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයක් ස්ථාපනය කරන ලද අතර එමගින් දිවයිනේ විසිරී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සහ විශ්වවිද්‍යාල නව සොයා ගැනීම් හඳුන්වා දීමට අවස්ථාව උදාකර දෙන ලදි. එමෙන්ම ඔවුන්ගේ නිෂ්පාදන සඳහා දේශීය - විදේශීය වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීමට සුවිශේෂ අවස්ථාව ද උදාකර දෙන ලද අතර, මෙම ප්‍රදර්ශනය සඳහා විදේශීය රටවල් ගණනාවක් මෙන්ම දේශීය නිෂ්පාදකයින් එකට එක්වන පරිශ්‍රයක් ගොඩනැඟුනු බැවින් විදේශීය ආහාර සැකසුම් ක්‍රම පිළිබඳව දේශීය නිෂ්පාදකයින්ට, පාරිභෝගිකයින්ට හා අයෝජකයින්ට ගුණාත්මක, ආරක්ෂිත නව නිෂ්පාදන සැකසුම් හා ඇසුරුම්කරණය පිළිබඳ

*"We are only as strong as we are united, as weak as we are divided."*

**- J.K. Rowling**

අදහස් හුවමාරු කර ගත හැකි දුර්ලභ අවස්ථාවක් එකම පරිශ්‍රයක් තුළ දී ලබාගැනීමට හැකි විය.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආහාර සැකසුරුවන්ගේ සංගමය එක්ව මෙම ප්‍රදර්ශනය නව තවත් සාර්ථකව ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු කරන අතර එමගින් දේශීය ආහාර නිෂ්පාදකයන්ගේ හා ඇසුරුම්කරණයට අදාළ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන, විදේශීය වෙළෙඳපොළ වෙත ප්‍රවිශ්ට කිරීම තුළින් විදේශ ආයෝජන මෙන්ම විදේශ විනිමය රට තුළට ගලා ඒම වැඩි කිරීම අමාත්‍යාංශයේ මෙන්ම අප අංශයේ අභිලාශයයි.




## මියැසි වින්දන ගී ප්‍රසංගය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සුබසාධක සංගමය විසින් සංවිධානය කරන ලද "මියැසි වින්දන" ගී ප්‍රසංගය, ටී.එම්. ජයරත්න, විශාරද එඩ්වඩ් ජයකොඩි සහ නිරෝෂා විරාජිනී යන ප්‍රවීන ගායන ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් 2015 අගෝස්තු මස 28 වන දින කොළඹ ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලාවේ දී උත්කර්ෂවත්ව පැවත්විනි. මෙහි දැක්වෙන්නේ එහි විශේෂ අවස්ථා කිහිපයකි.



*"What is a drop of rain, compared to the storm? What is a thought, compared to the mind? Our unity is full of wonder which your tiny individualism cannot even conceive."* - Ken Levine

# රන්සළු
ரண் சலு | RAN SALU

## National Textile & Apparel Exhibition 2015



කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින්
සංවිධානය කරන ලද රන්සළු
ජාතික රෙදිපිළි හා ඇඟලුම් ප්‍රදර්ශනය 2015
දෙසැම්බර් මස 18 සිට 20 දක්වා
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙහි දී පැවැත්විනි.
මෙහි දැක්වෙන්නේ එහි විශේෂ අවස්ථා කිහිපයකි.







# Christmas Carols
## - Highlights -





**The Annual trip and get-together of the Welfare Society**
**Laya Beach Hotel, Wadduwa,**
**20th December, 2015**



